# 9 කෝණ

- **නිපුණතාව 21** : විවිධ කෝණ අතර සම්බන්ධතා විමර්ශනය කරමින් තීරණ ගනියි.
- **නිපුණතා මට්ටම 21.1** : ස්ථිතික හා ගතික සංකල්ප ඇසුරින් කෝණ විග්‍රහ කරයි.
- **නිපුණතා මට්ටම 21.2** : කෝණවල ප්‍රමාණාත්මක අගයයන් විමර්ශනය කරයි.

- **නිපුණතා මට්ටම 21.1ට අදාළ ඉගෙනුම් පල**
  - පරිසරයේ දක්නට ලැබෙන පිහිටීම් ඇසුරින් කෝණයක ස්ථිතික සංකල්පය හඳුනා ගනියි.
  - පරිසරයේ සිදුවන ඇතැම් භ්‍රමණ ඇසුරින් කෝණයක ගතික සංකල්පය හඳුනා ගනියි.
  - සරල රේඛා ඛණ්ඩ දෙකක් හමුවීමෙන් කෝණයක් සෑදෙන බව හඳුනා ගනියි.
  - කෝණයක රූපසටහනක් දී ඇති විට එහි බාහු සහ ශීර්ෂය හඳුනා ගනියි.
  - සරල දාරය භාවිතයෙන් සරල රේඛා ඛණ්ඩයක් ඇඳ නම් කරයි.
  - සරල දාරය භාවිතයෙන් විවිධ කෝණ ඇඳ නම් කරයි.
  - නම් කර දී ඇති කෝණයක රූපසටහනක් ඇසුරින් එහි බාහු, ශීර්ෂය හා කෝණය ලියා දක්වයි.
  - කෝණයක විශාලත්වය මනින උපකරණයක් ලෙස කෝණමානය හඳුනා ගනියි.
  - දෙන ලද සුළු/සෘජු/මහා කෝණයක් කෝණමානය භාවිතයෙන් මනියි.
  - කෝණමානය භාවිතයෙන් දෙන ලද විශාලත්වයෙන් යුත් සුළු/සෘජු/මහා කෝණ අඳියි.
  - දෙන ලද විශාලත්වයෙන් යුත් පරාවර්ත කෝණයක් ඇඳීම සඳහා කෝණමානය නිවැරදි ව හසුරුවයි.
- **නිපුණතා මට්ටම 2 1.2ට අදාළ ඉගෙනුම් පල**
  - සෘජුකෝණයක විශාලත්වය $90^0$ බව හඳුනා ගනියි.
  - සරල කෝණයක විශාලත්වය $180^0$ බව හඳුනා ගනියි.
  - $90^0$ හා $180^0$ කෝණ ඇසුරින් සුළු කෝණ, මහා කෝණ හා පරාවර්ත කෝණ හඳුනා ගනියි.

**ගුරුවරයාට අදහසක්**

6 ශ්‍රේණියේ දී සෘජුකෝණය ඇසුරෙන් සුළු කෝණ, සෘජු කෝණ, මහා කෝණ, සරල කෝණ හා පරාවර්ත කෝණ හඳුනා ගෙන ඇත. 7 ශ්‍රේණියේ දී ස්ථිතික කෝණ හා ගතික කෝණ හඳුනා ගැනීමටත්, නිවැරදිව කෝණ නම් කිරීමටත්, කෝණ මනින ඒකක හඳුනා ගැනීම හා කෝණමානය භාවිතයෙන් කෝණ මැනීමටත් ඉගෙන ගනියි. ඉදිරි ශ්‍රේණිවල ඉගෙන ගන්නා ජ්‍යාමිතික විෂය කරුණුවල දි කෝණ නම් කිරීම හා නම් කරන ලද කෝණ හඳුනා ගැනීමේ කුසලතාව අත්‍යවශ්‍ය බැවින් මෙහි දී ඉහත කුසලතා සංවර්ධනය කිරීම වැදගත් වේ.

**ඉගෙනුම් පල:**

- **පරිසරයේ දක්නට ලැබෙන පිහිටීම් ඇසුරින් කෝණයක ස්ථිතික සංකල්පය හඳුනා ගනියි.**
- **පරිසරයේ සිදුවන ඇතැම් භ්‍රමණ ඇසුරින් කෝණයක ගතික සංකල්පය හඳුනා ගනියි.**

⌘ මේ සඳහා ක්‍රියාකාරකමක් පහත දක් වේ.

⌘ 7 ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශයේ පිටු අංක 64 කෙරෙහි අවධානය යොමු කරන්න.

**ක්‍රියාකාරකම 01**

**ගුණාත්මක යෙදවුම්:**

- කණ්ඩායමකට එක බැගින් ඇමුණුම 9.1 හි පිටපත්

**ගුරු කාර්යය**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර කාර්ය පත්‍රිකාව බැගින් ලබා දෙන්න.
- කාමර තුළ හෝ සුදුසු බාහිර ස්ථානවලට ගාස් හෝ පරිසරයේ කෝණ දැකිය හැකි අවස්ථා සටහන් කර ගෙන එන ලෙස උපදෙස් දෙන්න.
- නැවත පන්ති කාමරයට පැමිණ, සටහන් කර ගත් කෝණ, කාණ්ඩ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එසේ වෙන් කළ පසු, විශාලත්වය වෙනස් වන කෝණ ගතික කෝණ ලෙසත්, වෙනස් නොවන කෝණ ස්ථිතික කෝණ ලෙසත් හඳුන්වන බව පවසන්න.
- ගතික ස්වභාවයේ දී කෝණයේ එක් බාහුවක් පමණක් හෝ දෙකම හෝ චලනය වන අවස්ථා ඇති බව ද ස්ථිතික අවස්ථාවේ දී බාහු දෙකම චලනය නොවන බව ද උදාහරණ දෙමින් වැඩි දුරටත් පැහැදිලි කරන්න.
- පෙළපොතේ 91 පිටුවේ 9.1 අභ්‍යාසය කෙරෙහි අවධානය යොමු කරන්න.

**සිසු ක්‍රියාකාරකම්**

- ඇමුණුම 9.1 කාර්ය පත්‍රිකාවට අනුව ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.

**ඉගෙනුම් පල**

- සරල රේඛා ඛණ්ඩ දෙකක් හමු වීමෙන් කෝණයක් සෑදෙන බව හඳුනා ගනියි.
- කෝණයක රූපසටහනක් දී ඇති විට එහි බාහු සහ ශීර්ෂය හඳුනා ගනියි.
- සරල දාරය භාවිතයෙන් විවිධ කෝණ ඇඳ නම් කරයි.
- නම් කර දී ඇති කෝණයක රූපසටහනක් ඇසුරින් එහි බාහු, ශීර්ෂය හා කෝණය ලියා දක්වයි.

⌘ මේ සඳහා ක්‍රියාකාරකම් එකක් පහත දැක් වේ.

**ගුණාත්මක යෙදවුම්**

- එක් සිසුවෙකුට එක බැගින් වන සේ කාර්ය පත්‍රිකාවේ පිටපත් ලබා දෙන්න.

**ගුරු කාර්යය**

- කාර්ය පත්‍රිකාවේ පරිදි ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- පෙළපොත පළමු කොටසෙහි 91 හා 92 පිටුවල ඇති කෝණ නම් කිරීම පිළිබඳ සටහනට අනුව සිසුන්ට උපදෙස් ලබා දෙන්න.
- සිසුන් කාර්යය නිම කළ පසු ක්‍රියාකාරකමේ පිළිතුරු සාකච්ඡා කරමින් පෙළපොතේ 9.2 අභ්‍යාසය වෙත සිසුන් යොමු කරන්න.